**රඹුක්කන ප්‍රාදේශීය සභාව.**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් රු. 461,569 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | වර්ෂයට අදාල ආදායම්, වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. | 2020 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව රු. 499,502 කින් ණයගිම් අධි වෙන් කිරීම් සිදු කර තිබීම නිසා ණයගිම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල ණයගිම් ප්‍රතිපාදන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. | 2020 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම් රු.745,694 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. | 2020 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 5,684,963 ක එකතු වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුය. | පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 (අ) හා (ආ) උප වගන්ති | 2011 වර්ෂයෙන් පසුව මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලින කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ii) | 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටල් 03 කින් සියයට 1 දක්වා වූ ගාස්තු රු.1,233,395 ක් අයකර නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන විමසුමේ සඳහන් හෝටල් සම්බන්ධයෙන් කඩිනමින් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | 158 (1) (ආ) උපවගන්තිය | වසරකට වැඩි කාලයක සිට පෞද්ගලික දේපල සඳහා අයනොවූ රු.241,143 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අයකර ගත නොහැකි මුදල් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) | 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාල වටිනාකම රු.2,183,602 ක්වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මු.රෙ.571(2) අනුව කල් ඉකුත් වූ තැන්පත් ආදායමට ගැනීමට විෂය භාර නිලධාරින්ව දැනුවත් කළ බවත්, මේ වන විට රු. 1,858,521 ක මුදලක් ආදායමට ගැනීමට කටයුතු කර ඇති බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,858,197 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,461,090 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 6,681,613 | 4,690,572 | 4,572,440 | 815,102 | 6,186,286 | 5,697,341 | 5,397,065 | 1,077,221 |
| ii | කුලී | 12,007,295 | 13,481,206 | 13,076,706 | 1,231,848 | 11,912,975 | 11,800,805 | 11,322,271 | 1,011,890 |
| iii | බලපත්‍ර ගාස්තු | 4,317,500 | 3, 249,249 | 3,244,219 | 82,789 | 4,423,360 | 4,580,776 | 4,497,987 | 82,789 |
| iv | වෙනත් ආදායම් | 52,854,422 | 37,575,487 | 16,875,313 | 26,257,772 | 25,614,500 | 69,093,287 | 18,272,664 | 52,413,213 |

#### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 113,781 ක් වූ අතර, එහි වර්ෂයක කාලයක් ඉක්මවා ඇති අයවිය යුතු ශේෂය රු. 99,370 ක් විය. | හිඟ ආදායම් අයකරගත යුතුය. | වර්ෂයක් ඉක්ම වූ ශේෂයෙන් රු.72,116 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සම්බන්ධ වී කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් ඉතිරි හිඟ ශේෂය 2020 වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කරමි. |

#### 2.2.3 කඩ කාමර කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කුලී ශේෂය රු. 671,296 ක් වුවද, 2020 වර්ෂයේදී එයින් රු.20,150 ක් අයවී තිබුණි. වසරක කාලයක් ඉක්මවා ඇති අයවිය යුතු ශේෂය රු. 269,496 ක් විය. | හිඟ ආදායම් ප්‍රමාදයකින් තොරව අයකර ගැනිමට කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 19 දින පැවති කෑගල්ල දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටුවේදී මෙ පිළිබඳ සාකච්ඡා කරන ලදී. එහිදි තාක්ෂණික වාර්තාවක් ගෙන එම වාර්තාව අනුව කටයුතු කිරිමට තිරණය වූයෙන්, ඒ අනුව ඉදිරි කටයුතු සඳහා යොමුවන බව දන්වමි. |

2.2.4 පරිසර බලපත්‍ර

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත්ව තිබූ පරිසර බලපත්‍ර 45 ක් අළුත් කිරීමට කටයුතු නොකිරීම මත සභාවට රු. 180,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | කල් ඉකුත් වූ බලපත්‍ර අළුත්කිරීමට කටයුතු කළ යුතුය. | සියලුම බලපත්‍රලාභීන්ට අලුත් කිරීම සඳහා ලිඛිතව දැනුවත් කර ඇති අතර, අළුත් කිරීම සිදු නොවූ කර්මාන්ත සඳහා නැවත දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පරිසර බලපත්‍ර ලබා නොගෙන අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත හඳුනාගෙන විධිමත් කිරීම තුලින් එකී කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මකවී නොතිබුණි. | පරිසර පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. | ක්ෂේත්‍ර පරීක්ෂාවේදී හඳුනා ගන්නා ලද අනවසර කර්මාන්ත සඳහා ලේඛනයක් නඩත්තු කිරීමට මේ වනවිට කටයුතු කරන බවත්, එම කර්මාන්ත නීත්‍යානුකූල කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත් දන්වමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,442,361 ක් හා මුද්දර ගාස්තු රු. 23,815,095 ක් වූ අතර වර්ෂයක කාලයක් ඉක්මවා අයවිය යුතු ශේෂය පිළිවෙලින් රු. 1,742,183 ක් හා රු. 3,815,095 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකරගත යුතුවේ. | උසාවි දඩ/ මුද්දර ගාස්තු සම්බන්ධව අදාළ ආයතන නිරන්තර දැනුවත් කිරීම සිදු වුවද සමාලෝචිත වර්ෂයට ආදාල මුදල් සභාව වෙත ලැබෙන්නේ එම වර්ෂයේ නොවන බව දන්වමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රථ වාහන නතර කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව 2005 ජූලි 15 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කර තිබුණද එහි සඳහන් පරිදි වැළඳ ගැනීමට කටයුතු නොකිරීම නිසා රු. 222,256 ක ආදායමක් අහිමි වී තිබුණි. | අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. | පින්නවල අලි අනාථාගාරය අසල රථ වාහන නතර කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීම සිදුවන බවත්, ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් වාහන නවතා තැබීමේ ස්ථාන සභාව සතුව නොමැති බැවින් අයකිරීම සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී ඇති බව දන්වමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු වන කසළ මඟින් කොම්පොස්ට් නිෂ්පාදනය කර ඉතිරිවන කසළ බැහැර කිරීමද එම ඉඩම තුළම අක්‍රමවත්ව සිදුකර තිබුණි. | කසළ බැහැර කිරීම ක්‍රමවත්ව සිදු කල යුතුය. | ඉතිරිවන කසළ බැහැර කිරිම මේවන විට ක්‍රමවත්ව සිදු වන බවත්, මේ සඳහා වෙනත් ඉඩමක් මිලදී ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති බවත් දන්වමි. |
| (ii) | පොළිතීන් වැනි නොදිරන ද්‍රව්‍ය දහනය කිරීම සඳහා සභාව සතුව දාහකයක් නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. | සනිපාරක්ෂක කසළ රඳවනයක් සඳහා අවධානය යොමු කර ඒ සඳහා ඉඩමක් මිලදී ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කළ යුතුය. | 2020 වර්ෂයට තිරසර සංවර්ධන ඉලක්ක සකස් කිරිමට කටයුතු කරන බව දන්වමි. |

3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| පළාත් පාලන අමාත්‍යාංශයෙන් හා සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබූ රු.57,059,225 ක් වටිනා වාහන 24 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම වාහන සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුළත් සභාවට අයත් අක්කර 01 පර්චස් 39.67 ක ඉඩම් කොටස් 04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම් කොටස් 04 හි වටිනාකම නව තක්සේරුව අනුව 2020 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 වර්ෂයේ සිට රඹුක්කන නාගරික සංවර්ධන අධිකාරිය නමින් ජංගම වගකීම් යටතේ දැක්වෙන රු. 76,704 ක ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ජංගම වගකීම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී තවදුරටත් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |